Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2019-10-30

| | | |
|---|---|---|
| පැමිණිලිකාරිය | : | ඊ.ආර්.පී.එරන්ත මිය,<br>අංක 50/10ඒ, තානායම පාර,<br>රත්නපුර |
| වගඋත්තරකරු | : | විදුහල්පති,<br>ර/ශාන්ත ඇලෝසියස් ජාතික පාසල,<br>රත්නපුර. |
| <u>පැමිණිලි අංකය</u> | : | **<u>HRC/86/18</u>** |

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, කේ.ඩී.තිසුල් රන්සන සමරතුංග නැමැති තම දරුවා ර/ශාන්ත ඇලෝසියස් ජාතික පාසලෙහි 2018 වර්ෂයේ 1 වන ශ්‍රේණියට ඇතුළත් කිරිම සඳහා ආසන්නතා ගණය යටතේ අයදුම්පත් ඉදිරිපත් කර ඒ සඳහා වූ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 91 ක් ලබා ගෙන තිබියදීත් තම දරුවාගේ නම තාවකාලික ලැයිස්තුවට ඇතුළත් කර නොතිබුනු බවත් ඒ අනුව අභියාචනය ඉදිරිපත් කිරිමෙන් පසු අභියාචනා පරීක්ෂණයේදී ද ලකුණු 91 ක් ලබාදී තිබු අතර ඉහත පාසලේ කඩඉම් ලකුණු ප්‍රමාණය ලකුණු 80ක්ව තිබියදීත් තම දරුවාව පාසලට ඇතුළත් කිරිම සඳහා තෝරා ගෙන නොමැති බවත්ය.

එබැවින් මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කර තම දරුවා 2018 වසරේ රත්නපුර ශාන්ත ඇලෝසියස් විදුහලට ඇතුළත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙසට මෙම පැමිණිල්ල මඟින් ඉල්ලා සිට ඇත.

**වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ල සම්බන්ධව මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ සිදුකරන ලද පරික්ෂණයේදී කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, 2017.08.21 වන දින අදාළ සම්මුඛ පරීක්ෂණය



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

සඳහා පැමිණිලිකාරිය කැඳවා ඇති අතර, ඉදිරිපත් කරන ලද ලේඛන ප්‍රකාර පැමිණිලිකාරිය වෙත ලකුණු 91 ක් ලබාදී ඇති බවත්, සියලුම අයදුම්කරුවන්ගේ පදිංචිය සනාථ කර ගැනීම සඳහා ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන ලද අතර 2017.10.05 වන දින මෙම පැමිණිලිකාරියගේ පදිංචිය පරීක්ෂා කිරීමට තමා සමඟ කණ්ඩායමක් ගිය බවත්, එහිදී අංක 50/10 ඒ දරණ නිවස සම්පූර්ණයෙන් බද්දු ගෙන තිබුණත් එම අවස්ථාවේ තවත් යුවලක් දරුවන් තිදෙනෙකු සමඟ එහි පදිංචිව සිටි බවට නිරීක්ෂණය වූ බවත්ය. එම නිවසේ පදිංචි අයගෙන් පැමිණිලිකාරියගේ පදිංචි ස්ථානය පෙන්වන ලෙස ඉල්ලා සිටියත් ඔවුන් එයට අපොහොසත් වූ බවද සඳහන් කර ඇත. ඉන් අනතුරුව අභියාචනා මණ්ඩලයට යොමු කිරීමෙන් පසු එම මණ්ඩලය මඟින්ද 2017.12.13 දින කරන ලද පරීක්ෂණය අනුව පදිංචිය තහවුරු නොවූ බව වගඋත්තරකරු විසින් කියා සිටින අතර ඒ අනුව අභියාචනා මණ්ඩලය සකස් කරන ලද ලේඛනයට දරුවාගේ නම ඇතුළත් නොවීම නිසා 2018 වසරේ පළමු ශ්‍රේණියට මෙම දරුවා ඇතුළත් කර නොගත් බවට සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :-**

මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය තම දරුවා ඉහත කී වගඋත්තරකාර විද්‍යාලයේ 2018 වසරේ පළවන ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා චක්‍රලේඛ අංක 22/2017 ප්‍රකාර ආසන්නතාවය පදනම මත අයදුම් පත්‍ර ඉදිරිපත් කර ඇති අතර, 2018.08.21 වන දින පැවති සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී ලකුණු 91 ක් ලබා ගෙන ඇති බව අනාවරණය වේ. එම ලකුණු පිළිවෙලින් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| පදිංචිය | ලකුණු | 30 |
| පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන | ලකුණු | 5 |
| ලියාපදිංචි බද්දු ඔප්පුව | ලකුණු | 6 |
| ආසන්නතාවය | ලකුණු | 50 |
| මුළු ලකුණු | ලකුණු | 91 |

වගඋත්තරකාර විද්‍යාලයට මෙම ගණය යටතේ සිසුන් ඇතුළත් කර ගැනීමේ කඩඉම් ලකුණු සීමාව ලකුණු 80 ක් වේ.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් 2017.10.05 දින ස්ථානීය පරීක්ෂණයක් සිදුකර ඇති අතර එම අවස්ථාවේ පැමිණිලිකාරිය හෝ ඇයගේ කලත්‍රයා එම නිවසේ රැඳී සිට නොමැත. ඒ බව පැමිණිකාරිය විසින්ද පිළිගෙන ඇත.

පළවන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් පසුව නිකුත් කරන ලද තාවකාලික ලැයිස්තුවේ දරුවාගේ නම නොතිබීම නිසා පැමිණිලිකාරිය විසින් අභියාචනා මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කර එම පරීක්ෂණය සඳහා 2017.11.30 වන දින ඉදිරිපත් වීමෙන් පසු ලකුණු 91 ක් ප්‍රමාණය යළිත් වරක් තහවුරු කර ඇති බවද නිරීක්ෂණය වේ.

අභියාචනා මණ්ඩලය විසින් 2017.12.13 දින කරන ලද ස්ථානීය පරීක්ෂණයේදී පැමිණිලිකාරියගේ දරුවා සමඟ පැමිණිලිකාරිය එහි සිටි බවට අභියාචනා මණ්ඩලයේ පරීක්ෂණයට සහභාගි වූ පාසලේ විදුහල්පතිවරයා විසින් පිළිගෙන ඇත.

මේ අනුව පැමිණිලිකාරිය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා පරීක්ෂණ මණ්ඩල දෙකෙහිදීම චක්‍රලේඛනය ප්‍රකාර අවශ්‍ය ලේඛන ඉදිරිපත් කර ලකුණු 91ක් ලබා ගෙන ඇති බව නිරීක්ෂණය වේ. තවද පළවන ස්ථානීය පරීක්ෂණයේදී පැමිණිලිකාරිය සහ කලත්‍රයා නිවසේ රැඳී නොසිටි බවත් පැමිණිලිකාරිය රත්නපුර පළාත් මහ රෝහලේ දැඩි සත්කාර ඒකකයේ හෙද නිලධාරිණියක ලෙස සේවය කරන අතර ඇය 2017 ඔක්තෝබර් මස 04 වන දින රාත්‍රී සේවා මුරයෙහි සේවයේ යෙදී ඇති බවත් පසු දින එනම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ස්ථානීය පරීක්ෂණය සඳහා සහභාගි වූ දින සේවා මුරය ආවරණය කර ඇති බවත් සනාථ කරමින් රත්නපුර පළාත් මහ රෝහලේ දැඩි සත්කාර ඒකකයේ පළමු ශ්‍රේණියේ හෙද නිලධාරිණි සහ අංශ භාර විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි අත්සන් කරන ලද ලිපියක් 2017.11.07 දිනැති ලිපිය සමඟ වගඋත්තරකාර විදුහල්පතිවරයා වෙත ඉදිරිපත් කර ඇති බවද නිරීක්ෂණය වේ.

තවද පැමිණිලිකාරියගේ කලත්‍රයා වන කේ.ඩී. ප්‍රදීප් ඉන්දික සමරතුංග යන අය නෙලුව, බටුවන්ගල පෞද්ගලික තේ කර්මාන්ත ආයතනයක තොරතුරු තාක්ෂණ කළමණාකරු ලෙස සේවය කරන බවත් ඒ අනුව, '2017.10.03 සිට 2017.10.08 දක්වා කාලය තුළ මෙම අය ආයතනය තුළ අඛණ්ඩ සේවයෙහි යෙදී සිටි බවට' සහතික කරමින් අධාරදෙනිය වත්ත පුද්ගලික සමාගමේ අධ්‍යාක්ෂවරයා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක්ද පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇත. එබැවින් පැමිණිලිකාරිය සහ ඔවුගේ කලත්‍රයාගේ රාජකාරිමය තත්වය හේතුවෙන් පළවන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැවැත්වූ ස්ථානීය පරීක්ෂණයේදී ඔවුන් නිවසේ නොසිටිම සාධාරණය කරුණක් බව නිරීක්ෂණය වේ. තවද අභියාචනා මණ්ඩලය විසින් කරන ලද ස්ථානීය පරීක්ෂණයේදී පැමිණිලිකාරිය සහ ඇයගේ දරුවන් එහි සිටි බවත් ඔවුන් සමඟ කථා කළ බවත් අභියාචනා මණ්ඩලය සහ පරීක්ෂණය සඳහා සහභාගි වූ පාසලේ විදුහල්පතිවරයා පිළිගෙන ඇත. තවද පැමිණිලිකාරියගේ වැඩිමහල් දරුවාද මෙම පාසලේ 4 වන ශ්‍රේණියේ පන්තියක ඉගෙනුම ලබමින් සිටින බවද නිරීක්ෂණය වේ.

ඉහත කී කරුණු සලකා බැලීමේදී, පාසලේ කඩඉම් ලකුණු සීමාව ලකුණු 80 ක් වන අතර පැමිණිලිකාරිය චක්‍රලේඛ අංක 22/2017 අනුව අයදුම්පත් ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණයේදී සහ අභියාචනා පරීක්ෂණයේදී ලකුණු 91 ක් ලබා ගෙන ඇති බව නිරීක්ෂණය වේ. තවද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ස්ථානීය පරීක්ෂණයේදී පැමිණිලිකාරිය සහ කලත්‍රයා නොසිටීම රාජකාරි ස්වභාවය නිසා සිදුවූවක් බව අභියාචන මණ්ඩලයේ පරීක්ෂණයේදී පැමිණිකාරිය සහ ඇයගේ දරුවා නිවසේ රැඳී සිටිම තුළින් තහවුරු වන බවත් නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

ඉහත කී සමස්ථ කරුණු සලකා බැලීමේදී පැමිණිලිකාරියගේ දරුවා හට පාසලට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි වීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව පැමිණිලිකාරියගේ දරුවා වන කේ.ඩී.තිසුල් සමරතුංග දරුවාව ශාන්ත ඇලෝසියස් ජාතික පාසලේ 2018 වර්ෂයේ 1 වන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019.-11-29 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා,
   අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
   අධ්‍යාපන අමාත්‍යංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

B/ R-4